
ස්ටේජස් ජ්‍යෙෂ්ඨ වෘන්ද පාඨමාලාව
STAGES SENIOR ENSEMBLE
WORKSHOP
අධ්‍යයන ගොනුව

සියලුම හිමිකම් ඇවිරිණි. ප්‍රකාශකයාගේ ලිඛිත අවසරයෙන් තොරව මෙම ප්‍රකාශනයේ කිසිඳු කොටසක් නැවත සකස් කිරීම හෝ වෙනත් පිටකවරයකින් පළ කිරීම හෝ ප්‍රකාශයට පත් කර ඇති තත්වයෙන් හෝ තත්වයට වඩා වෙනස් ආකාරයකින් ප්‍රකාශයට පත් කිරීම හෝ සපුරා තහනම්.

**අධ්‍යයන ගොනුව**
**ස්ටේජස් ජ්‍යෙෂ්ඨ වෘන්ද පාඨමාලාව**

පළමු ප්‍රකාශනය (අන්තර්ජාල/ e - ප්‍රකාශන) 2020
© 2020 ස්ටේජස් නාට්‍ය කණ්ඩායම
ISBN 978-624-5487-31-8

# ස්ටේජස් ජ්‍යෙෂ්ඨ වෘන්ද පාඨමාලාව

# STAGES SENIOR ENSEMBLE

# **WORKSHOP**

අධ්‍යයන ගොනුව

පැවැත් වූ කාල සීමාව : 2018. මැයි 18 සිට අගෝස්තු 31 දක්වා

# පටුන

**ජ්‍යෙෂ්ඨ චෘන්ද පාඨමාලාව (Senior Ensemble Workshop)** **01 - 07**
ආකෘතිය සහ අන්තර්ගතය
- නාට්‍ය පාඨමාලාව කරන්න හිතුනේ ඇයි ?
- කා වෙනුවෙන්ද මේ පාඨමාලව සූදානම් කළේ ?
- මෙය මෙහෙය වූ අය කවුද?
- පාඨමාලව අවසාන වෙනකොට මොකක්ද අපිට සිදුවුණේ ?
- පාඨමාලාව අන්තර්ගතය ගැන පොඩ්ඩක් බලමු.

**පළමු කොටස** **08 - 17**
නාට්‍යකරණයේදී අවධානය ලබාදිය යුතු මූලික කරුණු පිළිබඳ සහ කණ්ඩායමේ සාමාජිකයන් අතර අන්තර් සම්බන්ධයක් ගොඩනැඟීම.
- කණ්ඩායමේ සාමාජිකයින් සමඟ සම්බන්ධයක් ගොඩනගා ගැනීම සහ ශරීරය උණුසුම් කරගැනීම.
- රංග අවකාශය හඳුනා ගැනීම.
- අවකාශයට ජීවයක් දීම.
- රංගයකට අවතීර්ණ වීම සහ රංගයක් අවසන් කිරීම.
- ඇස් මඟින් ගොඩනඟන සම්බන්ධය (Eye Contact)
- මිනිස් හැඟීම් හඳුනා ගැනීම

**දෙවන කොටස** **18 - 27**
රූපණ ක්‍රියාවලිය සම්බන්ධව සහ චරිත ගොඩනැඟීම සම්බන්ධව අධ්‍යයනය කිරීම.
- රූපණ ක්‍රියාවලිය සහ අධ්‍යයනය (Acting and Studying)
- භාණ්ඩ / ද්‍රව්‍යය අධ්‍යයනය මඟින් චරිත ගොඩනැඟීම (Object Study)
- සතුන්ගේ හැසිරීම අධ්‍යයනය මඟින් චරිත ගොඩනැඟීම (Animal Study)

**තෙවන කොටස** **28 - 31**
ස්වභාවික පරිසරයක ශරීරය නිදහස් කිරීම.
ස්වභාවික පරිසරයක ජීවත් වීම අධ්‍යයනය (Nature Training)

**සිව්වන කොටස** **32 - 35**

පාඨමාලාව අවසානයේ දී නිර්මාණය කරන ලද "Love and Other Objects" පුහුණු ක්‍රියාවලිය මඟින් ප්‍රායෝගිකව නිර්මාණයක් කිරීම සහ ප්‍රේක්ෂකාගාරයක් වෙත මුදාහැරීම දක්වා වූ ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම.

**පාඨමාලාව සඳහා සම්බන්ධ වූ කිහිපදෙනෙකුගේ අදහස්**

# ජ්‍යෙෂ්ඨ වෘන්ද පාඨමාලාව
# (Senior Ensemble Workshop)
## ආකෘතිය සහ අන්තර්ගතය


I was there...
2015

## නාට්‍ය පාඨමාලාව කරන්න හිතුනේ ඇයි ?

ස්ටේජස් නාට්‍ය කණ්ඩායම වශයෙන් අප වසර විස්සකට අසන්න කාලයක් පුරාවට ශ්‍රී ලාංකේය නාට්‍ය ක්ෂේත්‍රය තුළ සක්‍රීයව නාට්‍ය නිර්මාණ සිදුකරන නාට්‍ය කණ්ඩායමක්. එමෙන්ම, අපි සාමාජීය හා දේශපාලනික වශයෙන් වැදගත් ස්වතන්ත්‍ර සිංහල සහ ඉංග්‍රිසි භාෂා නාට්‍ය නිර්මාණ කරන නාට්‍ය කණ්ඩායමක් වීම ද සතුටට කරුණක්. පසුගිය දශක දෙක පුරාවට දේශීය මෙන්ම විදේශීය වශයෙන් එකතු කරගත් දැනුම හා අත්දැකීම් තවත් පිරිසක් සමඟ බෙදාගැනීමට අප ගත් තීරණයක මූලික අදියරක් වශයෙන්, 2015 වර්ෂයේ දී නාට්‍යකරණය පිළිබඳව න්‍යායාත්මක සහ ප්‍රායෝගික පාඨමාලාවක් ආරම්භ කළා. මෙම පාඨමාලාවේදී Devising Theater and Ensemble Theater ක්‍රමවේදය මූලිකවම යොදාගෙන රූපණය, අධ්‍යක්ෂණය මෙන්ම නාට්‍යකරණයට අවශ්‍ය මූලික දැනුම බෙදා ගැනීම සිදුවුණා. එහි දී අපි නාට්‍යය කණ්ඩායමක් වශයෙන් පුහුණු කරන ලද විනය සහ රංග ක්‍රමවේදයන් ආධුනික පිරිසක් සමඟ බෙදා ගත්තා.

## කවුරුන් වෙනුවෙන්ද මේ පාඨමාලව සූදානම් කළේ ?

වයස අවුරුදු 18ට වැඩි, නාට්‍ය නිර්මාණකරණයට ආශාවක්, උනන්දුවක් සහ කුතුහලයක් සහිත පිරිසකට මෙම පාඨමාලාව විවෘත වුණා. ඊට අමතරව, අනාගතයේ දී අපගේ නාට්‍ය කණ්ඩායමට සම්බන්ධ කර ගැනීමට බලාපොරොත්තු වන ඇතැම් ශිල්පීන්ට ද මෙම පාඨමාලවට ආරාධනා ලැබුණා.  ඒ හරහා ඔහුට හෝ ඇයට අප කණ්ඩායමේ ස්වරූපය සහ දැනුම බෙදාගන්නා ආකාරය සම්බන්ධව දැනුම සහ අධ්‍යයනයක් ලබාගැනීමට හැකි-වනු ඇතැයි අපගේ විශ්වාසයයි.

එහි පළමු පාඨමාලාව 2015 වසරේ දී සිදු කළ අතර එයට සහභාගි වූ ඇතැම් සාමාජිකයි-න් වර්ථමානයේ දී කෙටි කාලීනව සහ පූර්ණ කාලීනව අප නාට්‍ය කණ්ඩායම සමඟ කටයුතු කරනවා.

2018 වසරේ දී අපගේ දෙවන පාඨමාලාව සූදානම් කළ අතර, එහිදී ප්‍රායෝගික පරීක්ෂ-ණයකින් අනතුරුව විවිධ දක්ෂතා ඇති, සහ විවිධ ක්ෂේත්‍රයන්වල (නූතන නර්තනය, මැජික් ශිල්පය, ගෘහ නිර්මාණ ශිල්පය, නිරූපණ ක්ෂේත්‍රය, වෙබ් අඩවි නිර්මාණකරණය, කළමනාකරණය ආදී...) නිරතවන කුතුහලයක් සහිත කණ්ඩායමක් තෝරාගැනීමට අපට හැකියාව ලැබුණා. විවිධත්වයකින් සහ විවිධ වයස් කාණ්ඩවලින් යුතු වීම නිසා කණ්ඩාය-මේ දැනුම සහ අත්දැකීම විවිධ මානයන් වෙතට යොමුවුණා. 2018 මැයි 18 දින සිට සෑම සිකුරාදා දිනකම උදැසන 9 සිට සවස 5 දක්වා සති 15ක් පුරාවට රුවන්ති දි චිකේරා සහ ජයම්පති ගුරුගේ යන අයගේ මූලිකත්වයෙන් මෙම පාඨමාලාව පැවැත්වුණා.

## මෙය මෙහෙය වූ අය කවුද?

### රුවන්ති ද චිකේරා

රුවන්ති, නාට්‍ය රචකයෙක්, තිර රචකයෙක් සහ නාට්‍ය අධ්‍යක්ෂවරියකි.

### ජයම්පති ගුරුගේ

ජයම්පති, නාට්‍ය රචකයෙක්, අධ්‍යක්ෂවරයෙක්,රංගන ශිල්පියෙක්, අනුශාංග නිර්මාණ ශිල්පියෙක් සහ නළු පුහුණුකරුවෙක්.



## පාඨමාලව අවසාන වෙනකොට මොකක්ද අපිට සිදුවුණේ?

මෙම පාඨමාලාවේදී අප විශේෂයෙන් ම කණ්ඩායමක් වශයෙන් ඉතාම සුහද ගණුදෙනුවක් පවත්වාගෙන ගියා. වැඩමුළුව අවසානයේ දී, අප සමඟ එක් වූ පිරිස අප නාට්‍ය කණ්ඩායමේ සහෝදර පිරිසක් බවට පත්වුණා. එය හුදෙක් පාඨමාලවක් ඉක්මනින් අවසන් කිරීමට වෙහෙසෙනවාට වඩා කිසියම් කාලයක් එක්ව ගත කිරීම හරහා එකිනෙකා අතර ඇති දැනුම සහ අත්දැකිම් බෙදාගන්නා තත්ත්වයක් දක්වා වර්ධනය වුණා. එම වර්ධනය තුළින් සංවේදී මිනිසුන් පිරිසක් එකතු කරගැනීමට හැකියාව ලැබුණා. පාඨමාලාව අවසානයේ ප්‍රදර්ශනය කිරීමට සූදානම් කළ "Love and Other Objects" නාට්‍ය නිර්මාණය ද පාඨමාලාවේ ප්‍රතිඵලයක් වශයෙන් සුහද සම්බන්ධතා මත ගොඩනැගුණු නිර්මාණයක්. අපි කණ්ඩායමක් වශයෙන් තෝරාගත්තා "ආදරය" කියන තේමාව. මාස කිහිපයක් පුරාවට අපගේ සහ අප වටා සිටින අයගේ ජීවිතය හා බැඳුණු ආදරය සම්බන්ධ මතකයන් සහ අත්දැකීම් ලියුම් ආකාරයෙන් එකතු කර ඉන් තෝරාගත් සහ සංස්කරණය කරන ලද ලිපි කිහිපයක් නිර්මාණාත්මක ලෙස පිරිසක් ඉදිරියේ ඉදිරිපත් කිරීමට ගත් උත්සහයක් ලෙස "Love and Other Objects" දක්වන්න පුළුවන්.

## පාඨමාලා අන්තර්ගතය ගැන පොඩ්ඩක් බලමු.

පාඨමාලාව සඳහා අලුතින් එකතු වූ පිරිසට රංග අවකාශය, ශරිරය පුහුණු කිරීම, සතත අභ්‍යාස කිරීමේ ඇති වැදගත්කම මෙන්ම සමුහයක් වශයෙන් දැනුම සහ ජීවිතය බෙදාගැනීමේ ඇති වැදගත්කම පිළිබඳව Devising Theater සහ Ensemble Theater ක්‍රමවේද යොදාගෙන පාඨමාලාව සිදු කෙරුණා. ඒ හිදී

- යෝගා අභ්‍යාස (Yoga)
- ශ්වසන අභ්‍යාස (Birthing Exercises)
- කටහඬ පුහුණු අභ්‍යාස (Voice Training)
- භාවනා ක්‍රම හා අභ්‍යාස (Meditation)
- ශරිර සම්භාහන (Body Massage)
- ශිථිලකරණ අභ්‍යාස (Body Relaxing Exercises)
- රංග ක්‍රීඩා (Theater Games)
- වෘන්ද ක්‍රීඩා (Ensemble Game)
- රූපණ අභ්‍යාස (Acting Exercises)

## මෙම පාඨමාලාව කොටස් හතරකින් සමන්විත වුණා.

- **පළමු කොටස** - නාට්‍යකරණයේ දී අවධානය ලබාදිය යුතු මූලික කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම සහ කණ්ඩායමේ සාමාජිකයන් අතර අන්තර් සම්බන්ධයක් ගොඩනැගීම.
- **දෙවන කොටස** - රූපණ ක්‍රියාවලිය සහ චරිත ගොඩනැඟීම සම්බන්ධව අධ්‍යයනය කිරීම.
- **තෙවන කොටස** - ස්වභාවික පරිසරයක ශරීරය නිදහස් කිරීම.
- **සිව්වන කොටස** - පාඨමාලාව අවසානයේ දී නිර්මාණය කරන ලද "Love and Other Objects" පුහුණු ක්‍රියාවලිය මඟින් ප්‍රායෝගිකව නිර්මාණයක් කිරීම සහ ප්‍රේක්ෂකාගාරයක් වෙත මුදාහැරීම දක්වා වූ ක්‍රියාවලිය අධ්‍යනය කිරීම.

මෙම අධ්‍යයන ගොනුව මඟින් ඉදිරිපත් කරනු ලබන්නේ 2018 වසරේ පැවැත් වූ පාඨමාලා-වේ අන්තර්ගතය සම්බන්ධවයි. එම පාඨමාලාව තුළ මූලිකවම අවධානය ලබාදුන් කරුණු සහ සිදුකළ ඇතැම් රංග අභ්‍යාස සම්බන්ධව කෙටියෙන් විස්තර කෙරෙනවා.



# පළමු කොටස

නාට්‍යකරණයේදී අවධානය ලබාදිය යුතු මූලික කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම සහ කණ්ඩායමේ සාමාජිකයන් අතර අන්තර් සම්බන්ධයක් ගොඩනැගීම.

මෙම කොටසේ දී නවක සාමාජිකයින් ඔවුනොවුන් හඳුනා ගැනීම, කණ්ඩායමක් වශයෙන් වැඩ කිරීම සහ නාට්‍යය නිර්මාණකරණයේ දී අවශ්‍ය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු වුණා. මෙහිදී අලුතින් සම්බන්ධ වූ සියලුම දෙනා හට නාට්‍යකරණයට ප්‍රායෝගිකව අවතීර්ණ වීමේදී  දැනගත යුතු කරුණු සම්බන්ධව අපගේ අවධානය යොමු වුණා. විශේෂයෙන් මෙහිදී අප සමඟ එකතු වු පිරිස සම්බන්ධව සහ ඔවුන්ගේ ප්‍රායෝගික හැකියාව හඳුනා ගැනීම ද සිදු වුණා. සති කිහිපය පුරාවට මෙම පාඨමාලාවේදී සිදු කළ ක්‍රියාකාරකම් කිහිපයක් පිළිබඳ ව මෙහිදි සඳහන් කරන්න කැමතියි.

## ▪ කණ්ඩායමේ සාමාජිකයින් සමඟ සම්බන්ධයක් ගොඩනඟා ගැනීම සහ ශරීරය උණුසුම් කරගැනීම.

අවධානය ලබාදිය යුතු කරුණු

- අවකාශය හඳුනා ගැනීම.
- කණ්ඩායමට සවන් දීම.
- ක්ෂණිකව තිරණ ගැනීම.
- ක්‍රියාකාරකම වෙනස්වන ස්වභාවය හඳුනා ගැනීම.
- කණ්ඩායමට තමන්ගෙන් සිදුවිය යුතු වගකීම හඳුනා ගැනීම.

**ක්‍රියාකාරකම 01**

- සියලු දෙනා අවකාශය සමබර කරමින් ඇවිදින්න.
- ඇවිදින වේගය කණ්ඩායමක් වශයෙන් ක්‍රමයෙන් වැඩි කරන්න. (01 අවම - 10 උපරිම) තමන්ගේ වටේ ඉන්න අයට හොඳින් ඇහුම්කන් දෙමින්, අවධානය දෙමින් සියලුම දෙනා එක හා සමානව වේගය පවත්වා ගන්න.
- මේ ක්‍රියාකාරකම අතරවාරයේ ආශ්වාස, ප්‍රාශ්වාස කිරීම සහ ශරීරයේ සමබරතාව පවත්වා ගන්න.

**ක්‍රියාකාරකම 02**

- සියලුම දෙනා අවකාශය සමබර කරමින් ඇවිදින්න.
- අත්පුඩි වාර ගණනට අදාළ ක්‍රියාකාරකම් කරන්න.

    අත්පුඩි 01 - උඩ පැනීම.

    අත්පුඩි 02 - යන දිශාව සම්පූර්ණයෙන්ම මාරු කිරීම.

    අත්පුඩි 03 - නැවතීම.

    (මෙහෙයවන්නා විසින් අත්පුඩි ගසනු ලබන පිළිවෙල මාරු කරමින්, වේගය වෙනස් කරමින් මෙම ක්‍රියාවලිය පවත්වාගෙන සිදු කරයි.)

**ක්‍රියාකාරකම 03**

- කණ්ඩායමේ සාමාජිකයෙක් තෝරාගන්න
- ඔහු හෝ ඇය සමඟ කෙටි සුහද සංවාදයක් ගොඩනගා ගන්න. (එකිනෙකා හඳුනා ගැනීම ආරම්භ කිරීම)
- එම සංවාදය තුළදී ඔහු හෝ ඇය පිළිබඳව ඔබ එකතු කරගන්නා ලද තොරතුරු අනෙකුත් පිරිසට ප්‍රකාශ කරන්න.

## ■ රංග අවකාශය හඳුනා ගැනීම.

අවධානය ලබාදිය යුතු කරුණු.

- රංග අවකාශය ගොඩනැඟා ඇති අමුද්‍රව්‍යයේ ස්වභාවය හඳුනා ගැනීම.
- ගෘහ නිර්මාණාත්මක ආකෘතිය හඳුනා ගැනීම.
- අවකාශයේ ශබ්දයන් හා නාදයන් ගලාගෙන යන ආකාරය හඳුනා ගැනීම.
- ආලෝකය වැටෙන ආකාරය හඳුනා ගැනීම.
- ප්‍රේක්ෂකයන් ස්ථානගත කිරීම හඳුනා ගැනීම.
- විවිධ තලයන් හඳුනා ගැනීම.
- රංගය සඳහා අවතීර්ණ වීම සහ පිටවීමට ඇති හොඳම ආකාරය පිළිබඳව අවකාශය අධ්‍යයනය මඟින් හඳුනා ගැනීම.

**ක්‍රියාකාරකම 01**

- රංග අවකාශය හොඳින් අධ්‍යයනය කරන්න.
- එහි ඔබ කැමති ස්ථානයක් තොරාගන්න.
- එම ස්ථානයට ඔබගේ ශරීරය අනුගත කරමින් කෙටි රංගයක් ඉදිරිපත් කරන්න.

## ■ අවකාශයට ජීවයක් දීම.

අවධානය ලබාදිය යුතු කරුණු

- රංගනය මඟින් අවකාශයට ජීවයක් දීමේ හැකියාව අධ්‍යයනය කිරීම.
- රංගනයක දී එම අවකාශය කුමක්ද කියා ප්‍රේක්ෂකයා හඳුනා ගැනීමේ වැදගත් කම අවබෝධකර ගැනීම.
- කිසිවක් නොමැතිව රංගනය තුළින් පමණක් විවිධ අවකාශයන් ගොඩනැඟීමේ හැකියාව හඳුනා ගැනීම.
- එකම ස්ථානයක් තුළ එකිනෙකට වෙනස් වූ අවකාශයන් ගොඩනැඟීමේ හැකියාව. වාස්තවික අවකාශය  වෙනස් ආකාරයට අර්ථ කථනය කිරීමේ හැකියාව හඳුනා ගැනීම.

**ක්‍රියාකාරකම 01**

- කැමති ස්ථානයක හිටගන්න.
- එක් අඩියක් ඉදිරියට තබා අලුත් අවකාශයකට ඇතුල් වන්න. (කන්දක මුදුනක්, අපිරිසිදු වූ වැසිකිලියක්, අයිස් මිදෙන සීතල පරිසරයක් ආදී....)
- ඇතුල්වන විට එම ඇතුල් වු අවකාශය කුමක්ද කියා ප්‍රේක්ෂකයාට හඳුනාගත හැකිවන අයුරින් රංගය ගොඩනඟන්න. (මෙහෙයවන්නා විසින් කියනු ලබන විවිධ අවකාශයන් වෙත ඇතුල් වෙන්න.)

## ■ රංගයකට අවතීර්ණ වීම සහ රංගයක් අවසන් කිරීම.

අවධානය ලබාදිය යුතු කරුණු,

- රංගයක් ආරම්භ කරන මොහොත හඳුනාගැනීම.

- රංගයක් ආරම්භ කිරීමට ප්‍රථම රූපණ ශිල්පියාගේ මානසික අවධානය සහ සූදානම හඳුනා ගැනීම.
- රංගය ආරම්භ කරන පැහැදිලි මොහොත හඳුනා ගැනීම.
- රංගය ආරම්භ කරන විට ඇති හැඟීම සම්බන්ධව රූපණ ශිල්පියාගේ දැනුවත් භාවයේ ඇති වැදගත්කම හඳුනා ගැනීම.
- රංගයක් ආරම්භ කරන මොහොතේ රූපණ ශිල්පියාගේ මානසික ඒකාග්‍රතාව වැදගත් වීමට හේතු හඳුනා ගැනීම.
- රංගයේ ආරම්භය පිළිබඳව ප්‍රේක්ෂකයාගේ අවධානය ලබාගැනිම.
- රංගයක් ආරම්භ කිරීමට හැකි ආකර්ෂණීය ආකාර පිළිබඳව අවධානය ලබාදීම.

- රංගයක් අවසාන කරන මොහොත හඳුනා ගැනීම.

- රංගයක් අවසන් කරන මොහොත පිළිබඳව රූපණ ශිල්පියාට පැහැදිලි අදහසක් තිබීමේ වැදගත්කම හඳුනා ගැනීම.
- රංගය අවසන් බව ප්‍රේක්ෂකයාට පැහැදිලි වීමේ ඇති වැදගත්කම හඳුනා ගැනීම.
- රංගයක් අවසන් කිරීමට වඩාත්ම උචිතම මොහොත තිරණය කිරීම.

## ■ ඇස් මඟින් ගොඩනගන සම්බන්ධය (Eye contact)

අවධානය ලබාදිය යුතු කරුණු

- රූපණ කාර්යයකදී ඇස් මඟින් ගොඩනඟන සම්බන්ධයේ ඇති වැදගත්කම හඳුනා ගැනීම.
- රූපණ ශිල්පින්ගේ ඇස් ප්‍රධානම සන්නිවේදන මෙවලමක් බව හඳුනාගැනීම.
- රූපණ ශිල්පීන් අතර ඇස් මඟින් ගොඩනැඟිය හැකි සම්බන්ධයේ ඇති වැදගත් කම හඳුනා ගැනීම.
- ප්‍රේක්ෂකයා සමඟ ඇස් මගින් ගොඩනඟන සම්බන්ධයේ ඇති වැදගත්කම හඳුනා ගැනීම.
- හැඟීම වෙනස් වනවිට ඇසේ ස්වභාවයට සිදුවන වෙනස හඳුනා ගැනීම.
- රංගයේ විශ්වසනීයභාවය ගොඩනැඟීම සඳහා ඇස් උපයෝගී කරගත හැකි ආකාරය හඳුනා ගැනීම.

**ක්‍රියාකාරකම 01**

- සියලු දෙනා අවකාශය තුළ ඇවිදින්න.
- ඇවිදින අතරවාරයේ අවකාශය මත ඇවිදින අනෙක් අයගේ ඇස් සමඟ සම්බන්ධයක් ගොඩනඟා ගන්න.
- එම සම්බන්ධය අවසන් වූ පසු හමුවන වෙනත් අයෙක් සමඟ අලුත් සම්බන්ධයක් ගොඩනඟා ගන්න.
- මේ ආකාරයට සමස්ත අවකාශය පුරවමින් (සමබර කරමින්) ඇවිදින්න.

**ක්‍රියාකාරකම 02**

- කණ්ඩායමේ එක් පුද්ගලයෙක් 'මිනීමරුවා' ලෙස නම් කරන්න. තවත් පුද්ගලයෙක් 'රහස් පොලිසිය' ලෙස නම් කරන්න. (මේ දෙදෙනාව කණ්ඩායමේ අනෙකුත් පිරිස දැනගත නොයුතුයි.)
- කණ්ඩායම එකිනෙකා අතර හොඳින් බලමින් (Eye Contact) අවකාශය පුරා ඇවිදින්න.

● ඇවිදින අතරවාරයේ 'මිනීමරුවා' කණ්ඩායමේ සාමාජිකයින්ට නොතේරෙන සේ එක් එක් පුද්ගලයන්ට ඇසක් ගසන්න. (ඇසක් ගැසීම යනු වෙඩි තැබීම යැයි අනුමාන කරන්න.)
● එයට ගොදුරු වූ පුද්ගලයා කෑගසමින් බිම වැටෙන්න.
● මේ ආකාරයට කණ්ඩායමේ ඉන්න සියලුම දෙනා මැරිය යුතුය.
● 'රහස් පොලිසිය' විසින් 'මිනීමරුවා' (ඇස ගසන පුද්ගලයා) කවුද යන්න හඳුනා ගන්න උත්සහ කරන්න.
(ඇතැම් අවස්ථාවන් වලදී 'මිනීමරුවන්' කිහිප දෙනෙක් කණ්ඩායම තුළට එකතු කිරීම කළ හැකියි.)

## ■ මිනිස් හැඟීම් හඳුනා ගැනීම

අවධානය ලබාදිය යුතු කරුණු

- විවිධ වු මිනිස් හැඟීම් හඳුනා ගැනීම.
- හැඟීම්වල විවිධ තලයන් (Levels) හඳුනා ගැනීම.
- හැඟීම අනුව ශරීරයේ සිදුවන වෙනස් වීම් හඳුනා ගැනීම.
- හැඟීම් පාලනය කිරීම.
- රූපණ ක්‍රියාවලියේදී හැඟීම් පාලනය කරගත යුතු ආකාරය හඳුනා ගැනීම.
- මිනිස් අභ්‍යන්තරික හැඟීම් බාහිරට පෙන්නුම් කළ හැකි ආකාරය හඳුනා ගැනීම.

**ක්‍රියාකාරකම 01**

- පැහැදිලි ඒක් හැඟීමකින් තවත් හැඟීමකට මාරුවීම සිදුකරන්න.

  (සතුට - දුක, කුතුහලය - බිය. ආදී...)
- එම හැඟීම වෙනස් වීම ඉතාමත් සෙමින් සිදු කරන්න.
- එම වෙනස් වීම ඉතාම ඉක්මනින් සිදුකරන්න.

**ක්‍රියාකාරකම 02**

- යම්කිසි ස්ථානයක එක් පුද්ගලයෙක් එක හැඟීමක ඉන්න.
- එම ස්ථානයට වෙනත් පුද්ගලයෙක් වෙනත් හැඟීමකින් පැමිණෙන්න.
- දෙදෙනාගේ මුණගැසීමත් සමඟ ඔවුන්ගේ තිබුණු හැඟීම වෙනස් කරන්න.
- එම හැඟීම වෙනස් වීම ඉතාමත් සෙමින් සිදුකරන්න.
- එම හැඟීම  වෙනස් වීම ඉතාම ඉක්මනින් සිදුකරන්න.





# දෙවන කොටස

රූපණ ක්‍රියාවලිය සම්බන්ධව සහ චරිත ගොඩනැගීම සම්බන්ධව අධ්‍යයනය කිරීම.

මෙම කොටස මඟින් අප උත්සහ කරන්නේ රූපණ ශිල්පියෙකුගේ විනය, සතත අභ්‍යාසය සහ රූපණ ක්‍රියාවලියට සමගාමීව චරිත ගොඩනැඟීම සම්බන්ධව අප විසින් සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම් කිහිපයක් පිළිබඳව සාකච්ඡා කිරීමටයි. විශේෂයෙන්ම කලාකරුවකු වීමට අවශ්‍ය පුද්ගලයින් විසින් තමන්ගේ ඇතුළාන්තයෙන්ම තමන්ව අධ්‍යයනය කිරීමට පෙළඹීම වැදගත් බව අප විශ්වාස කරනවා. එමෙන්ම, ක්‍රමානුකූලව තමන්ගේ ජීවන රටාව අධ්‍යයනය සහ අප වටා සිටින පුද්ගලයින් මෙන්ම සතා සිවුපාවන් සහ ද්‍රව්‍යයන් පිළිබඳව අපගේ ඇති අවධානය සහ අධ්‍යයනය වැදගත්. මෙහිදී කතා කිරීමට බලාපොරොත්තු වන්නේ එම පෙළඹවීම සඳහා කරන ලද මූලික අභ්‍යාස කිහිපයක් පිළිබඳවයි.

## ■ රූපණ ක්‍රියාවලිය සහ අධ්‍යයනය (Acting and Studying)

රූපණ ශිල්පින් තමන්ගේ එදිනෙදා ශරීරයේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය

අවධානය ලබාදිය යුතු කරුණු

- ශරීරය ගොඩනැගී ඇති ආකාරය අධ්‍යයනය කිරීම. (සැකිල්ල සහ මංශ පේශී)
- මානසික විවේකයේ ඇති වැදගත්කම හඳුනාගැනීම.
- තමන්ගේ ශරීරයේ ක්‍රියාවලිය පිළිබඳව අවධානයක් ලබාදීම.
- සමාජය සහ මිනිස් හැසිරීම සම්බන්ධව අධ්‍යයනය කිරීම.
- රූපණ ක්‍රියාවලිය සම්බන්ධව තමන්ට ඇති අදහස හඳුනාගැනීම
- තමන්ට තමන්ගේ චරිතයම රඟපෑමට හැකිද යන්න හඳුනාගැනීම.
- ශාරීරික සහ මානසික නිරෝගිකමේ වැදගත්කම හඳුනා ගැනීම.
- සතත අභ්‍යාසය කලාකරුවකුට කොතරම් වැදගත් වනවාද යන්න හඳුනාගැනීම.
- සාමන්‍ය ජීවිතයේ අප නොදැනුවත්ව සිදුකරන රඟපෑම් ඇත්දැයි හඳුනාඟැනීම.

**ක්‍රියාකාරකම 01**

- දවස තුළ තමන් නැවත නැවතත් සිදුකරනු ලබන එක් ක්‍රියාවලියක් තෝරාගන්න. (දුරකතනය භාවිතය, කෑම, ඇවිදීම, ඉඳගැනීම, කතා කිරීම ආදී.... )
- එම ක්‍රියාවලිය සිදුවන විට තමන්ගේ ශරීරයේ පිහිටීම අධ්‍යයනය කරන්න.
- එම ක්‍රියාවලියට සමගාමීව අවිඥානිකව සිදුවන ශරීර පුරුදු හඳුනාගන්න.

● තනියම සිටින විට දී එම ක්‍රියාවලිය සිදුකරන විට සහ පිරිසක් සමඟ සිටින විටදී එම ක්‍රියාවලියේ සිදුවන සමාන-අසමානතා අධ්‍යයනය කරන්න.
● එම ක්‍රියාවලිය සම්බන්ධව තමන්ට පැහැදිලි අදහසක් පැමිණි පසු ශරීරයට සහ පැවැත්මට අයහපත් යැයි හඳුනාගත හැකි ශරීර පුරුදු නැතිකර ගැනීම ආරම්භ කරන්න.
● මේ ආකාරයට දවස පුරාම තමන්ගේ සියලුම ක්‍රියාකාරකම් සම්බන්ධව අවධානයක් පවත්වා ගැනීම ආරම්භ කිරීමට උත්සහ කරන්න.

**ක්‍රියාකාරකම 02 - දෙදෙනෙක් -** A **සහ** B

● A ඉතාම සාමාන්‍ය ආකාරයට ඇවිදින්න පටන් ගන්න. B, A පසුපසින් ගොස් A ඇවිදින ආකාරය ඇතුළු සියලුම හැසිරීම් හැකි උපරිමය අධ්‍යයනය කරන්න. (මෙය විනාඩි 45 ක් පමණ අවමය කිරීම වැදගත්.)
● පාද තබන ආකාරය, අත් ක්‍රියාකරන ආකාරය, හිස පවත්වා ගන්නා ආකාරය, කොන්දේ ස්වභාවය ආදී සෑම චලනයක්ම ඉතාම තියුණුව ග්‍රහණය කරගන්න.
● B විසින් ග්‍රහණය කරගනු ලැබූ දේ තමන්ගේ ශරීරයට එකතු කරමින් A ගේ ස්වරූපය සහ ක්‍රියාවලිය අනුකරණය කරන්න.
● අනුකරණය කිරීම සම්බන්ධව තමන් සෑහිමකට පත් වූ පසු B තනිව ඇවිදීම ආරම්භ කරන්න.
● A එම ස්ථානයෙන් මදක් ඉවතට ගොස් B විසින් තමන්ව A අනුකරණය කරන ආකාරය හොඳින් නිරීක්ෂණය කරන්න. A නොදැනුවත්ව සිදුකරන ලද ශරීර පුරුදු ඇත්නම් ඒවා හඳුනා ගන්න.
● සමස්ත ක්‍රියාවලිය මඟින් හඳුනා ගත් හැසිරීම් සහ එම ශරීර පුරුදු ඇති වීමට හේතු වූ කරුණු සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම 03 - දෙදෙනෙක් - A සහ B**

- A ඇස් වහගන්න. B, A ගේ එක් අතකින් පමණක් අල්ලාගෙන නිදහස් අවකාශය තුළ ඇවිද්දවන්න.
- සමස්ත ක්‍රියාවලිය අවසන් වන තුරුම නිහඬව සිටීමට වග බලා ගන්න.
- අවශ්‍ය සියලු සන්නිවේදන ඉංගිතයන් අල්ලාගෙන සිටින අත හරහා පමණක් කරන්න.
- සැලකිය යුතු වේලාවක් A ව ඇවිද්දවීමෙන් අනතුරු ව ඔහුගේ/ඇයගේ අත අත්හැර තනි ව ඇවිදීමට සලස්වන්න. ඇස් වසාගෙන ඇවිදින නිසා A අසලින්ම ගමන් කිරීම වැදගත්.
- A ට කුඩා හෝ අනතුරක් ඇති නොවීමට වග බලා ගන්න..
- සමස්ත ක්‍රියාවලිය තුළදීම A විසින් තමන්ගේ ශරීර සංවේදීතාවයන් (Body Senses) විවර කරගනිමින් අවකාශය සමඟ සම්බන්ධයක් ගොඩනගාගන්න.

**ක්‍රියාකාරකම 04**

- තමන්ගේ ජීවිතයේ ඇත්ත කතාවක්/අත්දැකීමක් පිරිස ඉදිරියේ නිදහසේ කියන්න.
- එම කතාව නැවත මතකයෙන් ඒ කියපු ආකාරයටම කොළයක ලියන්න.
- නැවත එම කොළය බලාගෙන ඒ කතාව කියවන්න.
- එම කොළයේ ලියපු කතාව කණ්ඩායමේ එක් පුද්ගලයෙකුට පමණක් කියන්න. (රඟපෑමකින් තොරව සැහැල්ලුවෙන් එම කතාව කියන්න උත්සහ කරන්න)
- එම දෙබස් ටික කටපාඩම් වන තුරුම එම කතාව කිහිප විටක්ම නැවත නැවත කියන්න.
- අනතුරුව, නැවතත් පිරිස ඉදිරියට පැමිණ මුලින් කියූ කතාව, මුලින් කියපු ආකාරයටම තමන් විසින් උපරිම විශ්වාසනීයත්වය ගොඩනැගෙන අයුරින් ඉදිරිපත් කරන්න.

**ක්‍රියාකාරකම 05**

- තමන්ගේ ජීවිතය පාදක කරගෙන ස්වයංකථනයක් ගොඩනගන්න.
- එම ගොඩනගාගත් ස්වයංකථනය ඉදිරිපත් කිරීමේ දි සාමාන්‍යයෙන් තමන්ගේ ශරීරයෙන් ප්‍රකාශනය වන පුරුදු හඳුනා ගන්න.
- එම පුරුදු වෙනුවට ක්‍රමක්‍රමයෙන් අලුත් ශරීර පුරුද්දක් එකතු කිරීම ආරම්භ කරන්න.
- එසේ අලුතින් එකතුවන පුරුදු සමඟ තමන්ගේ කතාව වෙන චරිතයක් ආකාරයට විශ්වාසනීයත්වය රැකෙන සේ ඉදිරිපත් කරන්න.

## ■ භාණ්ඩ / ද්‍රව්‍යය අධ්‍යයනය මඟින් චරිත ගොඩනැගීම (Object Study)

අවධානය යොමු කළ යුතු කරුණු

- ද්‍රව්‍යයේ පෙනුම, ස්වභාවය, වර්ණය සහ ද්‍රව්‍යය ගොඩනැඟී ඇති අමුද්‍රව්‍යය හොඳින් අධ්‍යයනය කිරීම.
- භාණ්ඩය හැසිරවිය හැකි හෝ භාවිත කළ හැකි විවිධ ආකාරයන් අධ්‍යයනය කිරීම.

**ක්‍රියාකාරකම 01**

- භාණ්ඩයක් තොරා ගන්න.
- එම භාණ්ඩය හොඳින් අධ්‍යයනය කරන්න.
- භාණ්ඩයේ බාහිර පෙනුම ශරීරයෙන් අනුකරණය කරන්න.
- අනුකරණය කරන ලද ස්වරූපයෙන් යම්කිසි චලනයක් කරන්න.
- අනුකරණය කරන ලද ස්වරූපයෙන් සහ චලනයට අනුව තෝරාගත් භාණ්ඩයට අදාළව ශබ්දයක් උපකල්පනය කර නිර්මාණය කරන්න.
- තොරාගන්නා ලද භාණ්ඩයට අදාළව චලනය වන ආකාරය, ශබ්දය, ශරීරයේ හැඩය සහ මුහුණේ ඉරියව් හොඳින් හඳුනා ගන්න.
- ඒ හා සමාන ව අනුකරණය කරන තවත් කෙනෙකු සමඟ සංවාදයක් ගොඩනගන්න. (මෙහිදී දෙබස් අවශ්‍ය නොවන අතර යම්කිසි මොහොතක් ක්ෂණිකව නිරූපණය කිරීමක් පමණක් සෑහෙයි.)

**ක්‍රියාකාරකම 02**

- භාණ්ඩයක් අනුකරණය කරන්න.
- ක්‍රමානුකූලව පාලනය කරමින් චරිතයක් ගොඩ නැඟීමට අවශ්‍ය කරුණු පමණක් ඉතුරු කර ගනිමින් අනෙකුත් අවශේෂ දේ අත් හරින්න. (විශ්වාසනීය හැසිරීම් ඉතුරු කරගන්න)
- භාණ්ඩයේ ස්වරූපයට අදාළව ගොඩනඟන ස්වභාවය අනුව දෙබස් උච්චාරණය ආරම්භ කරන්න.

**ක්‍රියාකාරකම 03**

- තෝරාගන්නා ලද චරිතයකට අදාළව ගැළපෙන භාණ්ඩයක් තෝරා ගන්න.
- එම භාණ්ඩය අධ්‍යයනය තුළින් ගොඩනඟන චරිත ලක්ෂණ, තෝරාගන්න ලද චරිතය සමඟ එකතු කරමින් චරිතය ගොඩනඟන්න.

## ■ සතුන්ගේ හැසිරීම අධ්‍යයනය මඟින් චරිත ගොඩනැඟීම (Animal Study)

අවධානය ලබාදිය යුතු කරුණු

- සතුන්ගේ හැසිරීම් සහ මිනිස් හැසිරීම් වල ඇති සමානතා හඳුනා ගැනීම.
- සතුන් හැඟීම් ප්‍රකාශ කරන ආකාරය හඳුනා ගැනීම.
- සතුන්ගේ ශරීරය ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගැනීම.
- එක් එක් සතුන්ට ආවේනික වූ හැසිරීම් අධ්‍යයනය කිරීම.
- සතුන් ශබ්ද කරන ආකාරය සහ ශබ්ද කරන අවස්ථා හඳුනා ගැනීම.
- තමන්ගේ වර්ගයා සමඟ පවත්වන ගණුදෙනුව හඳුනා ගැනීම.
- වෙනත් වර්ගයක සතුන් සමඟ පවත්වන ගණුදෙනුව සහ දක්වන ප්‍රටිචාරය හඳුනා ගැනීම.

**ක්‍රියාකාරකම 01**

- කැමති සතෙක් තොරාගන්න.
- එම සතාගේ හැසිරීම් තියුණුව අධ්‍යයනය කරන්න.
- එම හැසිරීම හැකි උපරිමය තමන්ගේ ශරීරය මඟින් අනුකරණය කරන්න. (සියුම් හැසිරීම්, විශේෂිත වූ ලක්ෂණ සහ ශබ්ද කරන ආකාරය හඳුනා ගන්න. සතාව රඟපාලා පෙන්වනවාට වඩා සතා ආකාරයට හැසිරීමට උත්සහ කිරීම වැදගත්)

**ක්‍රියාකාරකම 02 - දෙදෙනෙක් -** A **සහ** B

- සතුන් දෙදෙනෙක් අනුකරණය කරන්න
- එම සතුන් දෙදෙනා මුණගැසුන විට දක්වන ප්‍රතිචාරය ක්ෂණික නිරූපණයක් මඟින් සොයා ගැනීමට උත්සහ කරන්න.

**ක්‍රියාකාරකම 03 - කණ්ඩායමක්**

● කණ්ඩායමේ සාමාජිකයින් සියලුම දෙනා එකතුව වර්ග තුනක සතුන් තොරාගෙන හොඳින් අධ්‍යයනය කර අනුකරණය කරන්න.

● කණ්ඩායමක් වශයෙන් ආහාර සොයාගෙන යාම. ආහාර සොයා ගැනීම. ආහාර අනුභව කිරීම යන අවස්ථා තොරාගත් සතුන් වර්ග තුන මාරු කරමින් සිදුකරන්න.

උදා : පෙන්ගුයින් - වඳුරා - කබරයා

පෙන්ගුයින් ආකාරයට ආහාර සොයා යෑම.
වඳුරන් ආකාරයට ආහාර එකතු කිරීම.
කබරයෙක් ආකාරයට ආහාර අනුභවය කිරීම.
මෙම සතුන් දෙදෙනෙක් අතර සිදුවන මාරුව තුළදී ක්‍රමානුකූලව ශරිරය පාලනය කරමින් ශරීරයෙන් එයට අනුගත වන ආකාරය කිරීමට උත්සහ කරන්න.

**ක්‍රියාකාරකම 04**

● තමුන් කැමති සතෙක් අධ්‍යයනය කරන්න.

● එම සතාව හැකි උපරිම අයුරින් අනුකරණය කරන්න.

● එම අනුකරණයෙන් ක්‍රමානුකූලව එම සතාගේ විශේෂ ලක්ෂණ, හැසිරීම් ඉතුරු කරගනිමින් මිනිසකු බවට පරිවර්තනය වීමක් සිදුකරන්න.

● එම සත්ව ලක්ෂණ සහිත මිනිසා අනුකරණය කරන ලද සතාගේ හඬ පිටකරන ආකාරය අනුව යම්කිසි තොරාගත් දෙබස් ඛණ්ඩයක් ඉදිරිපත් කරන්න.

● නැවතත් ක්‍රමානුකූලව එම මිනිසා, සතා බවට පත් වීම සිදුකරන්න.

**ක්‍රියාකාරකම 05 - කණ්ඩායම්**

● සතෙක් අධ්‍යයනය කර ඒ සතාගේ ඇති ලක්ෂණ පදනම් කරගෙන මිනිස් චරිතයක් ගොඩනගන්න.

● එම මිනිස් චරිතය, එවැනිම ආකාරයට ගොඩනඟන ලද මිනිසුන් කිහිප දෙනෙක් සමඟ ඇතිවන සංවාදයක්, අවස්ථාවක් ගොඩ නැගෙන අයුරින් ක්ෂණික නිරූපණ ක්‍රියාවලියක් සිදු කරන්න.

**ක්‍රියාකාරකම 06**

- එක සතෙක් හෝ සතුන් කිහිප දෙනෙක් ගැඹුරින් අධ්‍යයනය කරන්න.
- ඒ ඒ සතුන්ගෙන් තමන් ගොඩනැඟීමට බලාපොරොත්තු වන චරිතයට අදාළව සියුම් ලක්ෂණ, හැසිරීම් පමණක් ඉතිරි කරගන්න.
- එම සියුම් හැසිරීම් සාමාන්‍ය මිනිස් චරිතයක් තුළට එක් කරමින් විශ්වාසනීයත්වය ගොඩනැගෙන අයුරින් භාවිතා කර චරිතයක් ගොඩනඟන්න.

**ක්‍රියාකාරකම 07**

- රූපණ ශිල්පියෙකුට ලැබෙන පිටපතකට අදාළ චරිතය ගොඩනැඟීමට අදාළව සතෙක් තෝරාගන්න.
- එම චරිතයේ ඇති ලක්ෂණ මුල් කරගනිමින් එයට ගැළපෙන, විශ්වාස කළ හැකි අයුරින් එම සතා ගැඹුරින් අධ්‍යයනය කරන්න.
- චරිතය ගොඩනැඟීමට අවශ්‍ය හැසිරීම්, සතාගෙන් උපයාගත් හැසිරීම් සමඟ එකතු කරමින් චරිතය ගොඩනඟා ගන්න.



# තෙවන කොටස

ස්වභාවික පරිසරයක ශරීරය නිදහස් කිරීම.

මෙම අදියර තුළදී කණ්ඩායමේ සාමාජිකයෝ සමඟ ඉතාම පිටිසර ප්‍රදේශයකට ගොස් එහි ඇති කැලෑ, දිය ඇලි, කඳු මුදුන්, වෙල් යායවල් ආදී ස්ථානවල ජීවත් වුණා. මෙම අදියර වන විට කණ්ඩායමේ සාමජිකයින් අතර ඉතාම හොඳ සම්බන්ධයක්, බැඳීමක් ගොඩනැඟී තිබීම විශේෂයි. ගොඩනැගිලි තුළට කොටුවී, නාගරික පරිසරවල ජීවිතය සොයා වෙහෙසෙන අවදියක එම පරිසරයන්ගෙන් වෙන් වී නිදහස් අවකාශයන් මත තමන්ව නිදහස් කිරීමෙන් ලැබෙන ආශ්වාදය සහ මානසික සුවය මෙම කණ්ඩායමට ලබාදීම මෙම කොටසේ මූලික අරමුණක් වුණා.

## ■ ස්වභාවික පරිසරයක ජීවත් වීම අධ්‍යයනය (Nature Training)

- පරිසරය සහ මිනිසා අතර ඇති සම්බන්ධය හඳුනා ගැනීම
- ස්වභාවික පරිසරයක් තුළදී සිදුවන මානසික සැහැල්ලුව හඳුනා ගැනීම.
- ස්වභාවික පරිසරයට අනුගතවමින් ශරීරය මුදා හැරීමේ වැදගත්කම හඳුනා ගැනීම.
- නිදහස් අවකාෂයක ශරීරය නිදහස් කිරීම.
- සරල ජීවන රටාවක අත්දැකීම හඳුනා ගැනීම.
- මනස සැහැල්ලු කරන භාවනා ක්‍රම පුහුණු වීම.













# සිව්වන කොටස

පාඨමාලාව අවසානයේ දී නිර්මාණය කරන ලද "Love and Other Objects" පුහුණු ක්‍රියාවලිය මඟින් ප්‍රායෝගිකව නිර්මාණයක් කිරීම සහ ප්‍රේක්ෂකාගාරයක් වෙත මුදාහැරීම දක්වා වු ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම.

## ■ ඉතාම කෙටියෙන්....

අපි කණ්ඩායමක් වශයෙන් තෝරාගත්තා ආදරය කියන තේමාව. මාස කිහිපයක් පුරාවට අපගේ සහ අප වටා සිටින අයගේ ජීවිතය හා බැඳුනු ආදරය සම්බන්ධ මතකයන් සහ අත්දැකීම් ලියුම් ආකාරයෙන් එකතු කර ඉන් තෝරාගත් සහ සංස්කරණය කරන ලද ලිපි කිහිපයක් සත්‍යතාවය සුරැකෙන සේ නිර්මාණාත්මක ලෙස පිරිසක් ඉදිරියේ ඉදිරිපත් කිරීමට ගත් උත්සහයක් ලෙස දක්වන්න පුළුවන්.

(මෙම ක්‍රියාවලිය සම්බන්ධව වැඩිදුර කියවීම සඳහා “Love and Other Objects” අධ්‍යයන ගොනුව බලන්න)

# පාඨමාලාව සඳහා සම්බන්ධ වූ කිහිප දෙනෙකුගේ අදහස් කිහිපයක්

පාඨමාලවට සම්බන්ධ වුනේ නාට්‍යය කියන්නේ මොකක්ද කියල දැන ගන්න සහ රඟපාන්න. එතන කියපු හැම වචනයක්ම කරපු හැම දෙයක්ම අලුත්ම අත්දැකීමක්. ගොඩක්ම හිතන විදිහ වෙනස් වුනා.

**- පසිඳු හිරන්‍ය**

පාඨමාලාවට සම්බන්ධ වෙන්න හේතුව, මම ඒ වෙනකොටත් නාට්‍ය හා නිරූපණය ක්ෂේත්‍රයේ වැඩ කරමින් සිටියා ආධුනිකයෙක් වශයෙන්. එම නිසා ඒ පිළිබඳ තවත් අධ්‍යයනය කරන්න ඕන වුනා. මගේ ජීවිතේ වෙනස්ම අත්දැකීමක් කිව්වොත් නිවැරදියි. තාමත් එවැනි අත්දැකීමක් මම විඳලා නෑ. මනස සම්බන්ධව වැඩ කරන්න මම ඉගෙන ගත්ත තැන මෙතන.

මගේ ජීවිතේ ඉවසීම, බලාහිඳීම, සතුට, උත්සහා කිරීම නිවැරදිව හා දක්ෂව මගේ හැකියව පෙන්නුම් කරන්න, වගේම මගේ හිත, කය, වචනය පාලනය කරන්න ඉගෙන ගත්තේ මේ පාඨමාලවෙන්.

**- අශාන් ලක්ශාන්**

සම්මුඛ පරීක්ෂණයට එනකන් මම දැනගෙන හිටියේ නෑ Stages Theater Group එක ගැන. මගේ ජීවිතේ කරපු අමතක නොවෙන Audition එක ලෙස හඳුන්වන්න පුළුවන්. රුවන්තී අක්කා Audition එකේදී දුන්න අවස්ථාව තමයි තමන්ගේ ජීවිතය ප්‍රකාශ කරන්න. මගේ ජීවිතේ ලබපු අත්දැකීම මෙතැකැයි මට කියන්න බෑ. ඇත්තටම මට මේකෙන් ලැබුනේ කාන්චනා කියන්නේ කවුද කියලා තවදුරටත් සිතීමට සහ සෙවීමට අවස්ථාව ලැබුණා.

**- කාන්චනා මල්ශානි**

Artist කෙනෙක් වෙන්න පුහුණුවක් සහ දැනුම එකතු කරගන්න තමයි මම මේකට සම්බන්ධ වෙන්නේ. මට අලුතින් දැණුමක් ලැබුනා වගේම එතෙක් මා විසින් නිවැරදි යැයි තහවුරු කරගත් දේ සම්බන්ධයෙන් අර්ථකථනයන් ලැබෙන්න ගත්තා. මගේ ගමනට සරලව සිතීම සහ වැඩ කරන්න යතුරු ටිකක් ලැබුණා.

**- හිමන්ත වෙලගෙදර**

අපි ගෙවුව අන්තිම සතිය.. ඇත්තමයි මන් ජිවත්වුන සාමාන්‍ය පරිසරය. නගරයකට හිරවෙලා අපි කරන්නෙ බොරුව කියලත් හිතෙනව. බහුතරයක්ම නිර්මාණ බිහිවුනත් ඒවා මේ මහ පොළවටවත්, සමාජයටවත්, තමුන්ටවත්, උහුල ගන්න බැරි තරම් බොරුවක්. මිනිස්සු කරන නිර්මාණ ඇතුළෙ කිසිම අරමුණක් නැතිව ඔහෙ දුවනව. ඊලගට බිහිවෙන්න ඕන පරම්පරාව ගැන අදහසක් නෑ. ඒකයි මං  කියන්නෙ අපි මහපොළවත් එක්ක එදා ජිවත් උන එකේ වැදගත්කම. අඩුම තරමේ හානිය අවමයි.

අපිට තව එකෙක්ව දැනෙන්න පටන් ගත්තෙ නොදැනිම. ඇත්තටම මුල් කාලේ  තිබ්බ  තරහට වඩා  මිනිස්සුන්ට  කොහොමද ළංවෙන්නේ. එයාලට දෙයක් තේරුම් කරවන්න  පුළුවන් කියලා දැනෙනවා. මිනිස්සුන්ට සම්බන්ධතා  ගැන මීට වඩා  මානුෂීයව හිතන්න අපි කරපු අන්තිම වැඩේ වැදගත් වුණා. අපේ හිත්වලට ඒ වගේ සිතුවිලි වල ආරම්භය, පදනමක් වැටුනෙ අපි එකට ගතකරපු කාලය තමයි. ඉතින් අපි  නික්ම යාමකට වඩා ආරම්භයක් ගත්තා කියල මට හැම මොහොතකම හිතෙනවා.

**- පැතුම් ධර්මරත්න**

© ස්ටේජස් තියටර් ගැරන්ටී ලිමිටඩ්, 2020

මෙම අධ්‍යයන ගොනුව ස්ටේජස් නාට්‍ය කණ්ඩායමේ ‘Artist Research - Archiving and Documentation’ නම් ව්‍යාපෘතියේ කොටසක් ලෙස සම්පාදනය වූවකි.

ස්ටේජස් නාට්‍ය කණ්ඩායම වසර දහයක් පුරාවට කළ නිෂ්පාදන ක්‍රියාවලීන් විශ්ලේෂණය හරහා කලා භාවිතයේ නියුතු කලා ශිල්පීන් ඔවුන්ගේම නිර්මාණයන් ක්‍රමවත් හා විචාරාත්මක විශ්ලේෂණයට භාජනය කිරීම මෙම ව්‍යාපෘතිය හරහා සිදුවිය. මේ දශකය නම් ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය නිම වූ වසරේ සිට එළැඹි දස වසරයි (2009 සිට 2019 දක්වා).

ප්‍රකාශනයට පත්කිරීමේ අටියෙන් මෙවැනි අධ්‍යයන ගොනු දාසයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් නිම විය. කලා ශිල්පීන් විසින් පර්යේෂණකොට රචනා කරන ලද මේ සෑම අධ්‍යයන ගොනුවක්ම මෙම නිෂ්පාදන බිහි වූ සමාජ-දේශපාලනික සන්දර්භ වටපිටාවන් විභාග කරන අතර එම ක්‍රියාවලීන් තුළදී කරනා ලද නිර්මාණාත්මක තීරණ විශ්ලේෂණය කරයි. මේ ප්‍රයත්නයේම අංගයක් ලෙස ඊට සමගාමී වීඩියෝපට මාලාවක්ද නිර්මාණය කරන ලදී. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය හරහා නිෂ්පාදනය කරන ලද සියලුම සම්පත් www.stages.lk වෙබ් අඩවිය හරහා ඔබට ලබාගත හැක.

## අධ්‍යයන ගොනු

**සංස්කරණය (ලිඛිත):** රුවන්ති ද චිකේරා

**සංස්කරණය (වීඩියෝ):** මලිත් සුලාර

**භාෂා සංස්කරණය:** නිපුනි ශාරදා පතිරගේ (සිං), කිං රත්නම් (දෙ)

**රචනය:** රුවන්ති ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු, ජයම්පති ගුරුගේ, නදී කම්මැල්ලවීර, නිපුනි ශාරදා පතිරගේ, පියුමි විජේසුන්දර, නලින් ලුසේනා

**පිටු සැලසුම්:** මල්ෂානි දෙල්ගහපිටිය, රජිත පවිත්‍ර මධුභාෂ

**සෝදුපත් බැලීම සහ භාෂා සංස්කරණය:** ආශා අබේකෝන්, ගිහාන් ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු, යු.ඩී.ආර්.එච්.කේ.ගුණසිංහ, ට්‍රෙසි හොල්සින්ගර්, අරවින්ද ජයසේකර, නදී කම්මැල්ලවීර, නිපුනි ශාරදා පතිරගේ, සුදේශ්නා රන්මුතුගල, කිං රත්නම්, තිලකා සුභසිංහ.

**සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ:** ප්‍රසාද් අලුත්වත්ත, ඩේවිඩ් කොටරල්, සංජය එක්නැළිගොඩ, රජිත පවිත්‍ර මධුභාෂ, වෙනුර නවෝද්, දෙශාන් තෙන්නකෝන්

**සැලසුම් සහය:** කියාස් අහමඩ්, මල්ෂානි දෙල්ගහපිටිය, ජනිත් හර්ශන.

**පර්යේෂණ සහය:** කෞෂල්‍යා ආටිගල, නලින් ලුසේනා, රජිත පවිත්‍ර මධුභාෂ, අකලංක ප්‍රභාශ්වර, දිනුෂිකා සෙනෙවිරත්න

**පරිවර්තනය:** හිරණ්‍යදා දේවසිරි (සිං/ඉං), අරුන්දි ජයසේකර (සිං/ඉං), මනුලි ලවන්‍යා (සිං/ඉං), ලිහිණි නිලවීර (සිං/ඉං), ජිනාදනී පරමේශ්වරම් (දෙ), ශාමලා වේදනායගම් (දෙ), පියුමි විජේසුන්දර (ඉං), හිමංසි දෙහිගම (සි)

**කැමරාකරණය:** වෙනුර නවෝද්, කිං රත්නම්, ප්‍රමිල සමරකෝන්, කසුන් උක්වත්ත

**වෙබ් අඩවි නිර්මාණය:** රන්සක ගල්මන්ගොඩ

**කළමනාකරණය:** මල්ෂානි දෙල්ගහපිටිය, මහේෂ් ලක්මාල්

**ස්ටේජස් නාට්‍ය කණ්ඩායම**
**අධ්‍යයන ගොනු**

**DCS දශක හතක ශ්‍රී ලංකාව**
රචනය : රුවන්ති දි චිකේරා, නිපුනි ශාරදා පතිරගේ
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**DCS Girls at Checkpoints**
රචනය : පියුමි විජේසුන්දර
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**DCS ස්වයංකථන**
රචනය : රුවන්ති ද චිකේරා
සහය: පෙමන්ති ප්‍රනාන්දු
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**DCS රුවන්ඩා - ශ්‍රී ලංකා සහයෝගීත්ව නිර්මාණය**
රචනය : නිපුනි ශාරදා පතිරගේ
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ග්‍රීස් යකා**
රචනය: රුවන්ති ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**කළුමාලි : වැඩිහිටියන්ට සුරංගනා කතාවක්**
රචනය: රුවන්ති දි චිකේරා, නදී කම්මැල්ලවීර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**Love and Other Objects**
රචනය: ජයම්පති ගුරුගේ
සහය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**Ovaryactingæ**
රචනය : පියුමි විජේසුන්දර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**Passing Stage ව්‍යාපෘතිය**
රචනය: රුවන්ති ද චිකේරා
සහය: කෞෂල්‍යා ආටිගල, රජිත පවිත්‍ර මධුභාෂ
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: සංජය එක්නැළිගොඩ, රජිත පවිත්‍ර මධුභාෂ

**සිරියානු ස්වයංකථන**
රචනය: ජයම්පති ගුරුගේ
සහය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**The Certificate**
රචනය: රුවන්ති ද චිකේරා
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: සංජය එක්නැළිගොඩ

**Thought Curfew**
රචනය: පියුමි විජේසුන්දර
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ඩේවිඩ් කොටරල්

**Walking Path - වචන නැති නාට්‍යයක්**
රචනය: ජයම්පති ගුරුගේ
සහය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ස්ටේජස් කලා ශිල්පී පුහුණු වැඩමුළුව**
රචනය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**Stages Junior Ensemble**
රචනය: පියුමි විජේසුන්දර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ස්ටේජස් ජ්‍යෙෂ්ඨ වෘන්ද පාඨමාලාව**
රචනය: ජයම්පති ගුරුගේ
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

stages
theatre
group

# ස්ටේපස් ජෙයෂ්ඨ වෘන්ද පාඨමාලාව